# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.03 පැය 0805 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1981/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**සමාජ මාධ්‍ය මඟින් සංසරණය වන වීඩීයෝපටයක් සම්බන්ධව.**

පුද්ගලයන් දෙදෙනෙකු විසින් මෙහෙණින්වහන්සේ නමකට බැන තර්ජනය කරන සිදුවීමකට අදාලව වීඩියෝවක් මේ වන විට සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වෙමින් පවතී. මෙම වීඩියෝ පටයට අදාළ සිදුවීම 2025.11.02 වන දින රාත්‍රී කාලයේ වත්තල පොලිස් වසමේ කෙරවලපිටිය ප්‍රදේශයේ රත්නාවලී ආරාමය අසලදී සිදුව ඇත.

2025.11.02 වන දින රාත්‍රී කාලයේදීම මෙම මෙහෙණින්වහන්සේට බැන තර්ජනය කිරීමේ සිද්ධියට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු ප්‍රසිද්ධ ස්ථානයක කළහකාරී ලෙස හැසිරීමේ චෝදනාව යටතේ වත්තල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 58 හා 67 වයස්වල පසුවන වත්තල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් 2025.11.03 වන අද දින වැලිසර ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව ඇති

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**